## 52 – සමිඳේ ඔබ ඔබේ දෙසට

සමිඳේ ඔබ ඔබේ දෙසට සෙත සැලසුවෝ
වහල් කමින් ජාකෝබුවත් ගලවා ගත්තෝ
ඔබෙ ජනතා කරපු වැරදි අමතක කෙරුවෝ
ඔවුන්ගේ පව් කම් හැම ඔබ වළැ ලා දැම්මෝ

අනේ අපට පෙන්වනු ඔබෙ දයාව සමිඳේ
අපට ඔබේ ගැලවීමත් සලසා දෙන්නේ

තවද ඔබේ හිතවතුනට තොවත් සිතින් හා
එතුමන් වෙතැ හැරෙන්නනට සාමෙ ලැබෙන්නා
ඔබට බියැති අපට ඔබේ ගැලවුම ළං වේ
මෙ අප දෙසේ දෙව් මහිමේ ඇවිත් නතර වේ

දයාව හා හිතවත්කම එකතුවී සිටී
දැහැමියාව සමාදානෙ සිප වැළැඳ ගනී
හිතවත්කම පොළොවෙන් එයි මතුවෙලා නැගී
දැහැමියාව සුරලෝ සිටැ බලයි ගෙනැ නැමී

සමිඳෙ අපට සෙත් ආසිරි වස්වා දෙන්නේ
නගා දෙන්නැ අපේ බිමේ අස්වනු වැඩියේ
දැහැමියාව ගමන් කරයි එතුමනි දිරියේ
එතුමන් පියවර පස්සේ ගැලැවුම එන්නේ